# WEATHER FORECAST FOR 09 DECEMBER 2019

**(Issued at 05.30 a.m. on 09 December 2019)**

**Due to a low level atmospheric disturbance in the southeast of Sri Lanka prevailing showery condition over the island particularly in the Eastern, Uva, North-Central and Northern provinces is likely to enhance from today.**

Showers or thundershowers will occur at times in Eastern, Uva, North-central, Central, Northern and North-western provinces and in Hambanthota district. Showers or thundershowers will occur at several places elsewhere after 1.00 p.m.

Very heavy showers around 200 mm are likely at some places in Ampara, Batticaloa, Trincomalee Monaragala, Polonnaruwa, Badulla, Nuwara-Eliya and Kandy districts. Heavy showers of about (100-150) mm are likely in the Anuradhapura, Mullaitivu, Kilinochchi, Vavuniya and Matale districts. Fairly heavy showers of about (75-100) mm are likely in Galle, Kaluthara, Rathnapura, Kegalle and Hambanthota districts.

Fairly strong gusty winds up to (40-50) kmph can be expected in North-Western, Northern and North-Central provinces and in Hambanthota district.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

දිවයිනට ගිනිකොන දෙසින් පහල වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් දිවයින පුරා විශේෂයෙන්ම නැගෙනහිර, ඌව, උතුරු-මැද සහ උතුරු පළාත්වල පවතින වැසි තත්ත්වය අද දින සිට වැඩිවේ යැයි අපේක්ෂා කෙරේ.

නැගෙනහිර, ඌව, උතුරු-මැද, මධ්‍යම, උතුරු සහ වයඹ පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර සෙසු ප්‍රදේශවල තැනින් තැන ප.ව. 1.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, මොනරාගල, පොළොන්නරුව, බදුල්ල, නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්ක වල ඇතැම් ස්ථාන වලට මි.මී. **200** පමණ ඉතා තද වර්ෂාපතනයන් ද අනුරාධපුරය, මුලතිව්, කිලිනොච්චි, වවුනියාව සහ මාතලේ දිස්ත්‍රික්ක වල ඇතැම් ස්ථාන වලට මි.මී. **(100-150)** පමණ තද වර්ෂාපතනයන් ද ගාල්ල, කළුතර, රත්නපුර, කෑගල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල ඇතැම් ස්ථාන වලට මි.මී. **(75-100)** පමණ තරමක තද වර්ෂාපතනයන් ඇති විය හැක.

වයඹ, උතුර සහ උතුරු-මැද පලාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මි **40-50** දක්වා තරමක් තද සුළං ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 09 December 2019)

**Due to a low level atmospheric disturbance in the southeast of Sri Lanka, showery and windy condition expected to enhance in the southeastern, southern and southwestern sea areas.**

Showers or thundershowers will occur at several places in the sea areas extending from Kankasanturai to Galle via Trincomalee, Batticaloa and Hambanthota. Heavy showers can be expected at some places in the sea areas extending from Trincomalee to Hambanthota via Batticaloa. Showers or thundershowers will occur in the other sea areas during the afternoon or night.

Winds will be North-easterly and speed will be (30-40) kmph in the sea areas around the island.

The sea areas extending from Mullaitivu to Negombo via Kankasanturai, Mannar and Puttalam can be rough at times as the wind speed can increase up to **(50-55)** kmph at times. Other sea areas will be fairly rough at times as the wind speed can increase up to **50** kmph at times.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය 2019 දෙසැම්බර් මස 09 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

දිවයිනට ගිනිකොන දෙසින් පහල වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් දිවයිනට ගිනිකොන, දකුණු සහ නිරිත දෙසින් වන මුහුදු ප්‍රදේශවල වැසි සහ සුළං තත්ත්වය වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ.

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය, මඩකළපුව සහ හම්බන්තොට හරහා ගාල්ල දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර ත්‍රිකුණාමලය සිට මඩකළපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට තද වැසි ඇති විය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. **(30-40)** පමණ වේ.

මුලතිව් සිට කන්කසන්තුරය, මන්නාරම සහ පුත්තලම හරහා මීගමුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. **50-55** දක්වා ඉහළ යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. **50** දක්වා ඉහළ යාමට හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/12/09
Time : 0550 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT